# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,469 - 2025 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 16 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82747 - (2025/12)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ථ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරේ පුරප්පාඩුව පිරවීම.

1. දැනට පුරප්පාඩුව පවතින වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරු 01ක් පිරවීම සඳහා, මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ පරීක්ෂක නිලධාරින් අතුරින් පහත සුදුසුකම් සම්පූර්ණ කරන සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සපුරාලිය යුතු සුදුසුකම් :

   I. පළපුරුද්ද

      i. වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරේ වසර 05 ක ස්ථිර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

   II. වෙනත් සුදුසුකම් :

      i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
      ii. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.
      iii. III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. ( මෙය අදාළ වනුයේ වෙරළ සංරක්ෂණ නියාමක නව බඳවා ගැනීම් පටිපාටිය අනුව MN 01 සේවා ගණය යටතේ බඳවා ගත් නිලධාරීන් සඳහා පමණි.)
      iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. තනතුර සඳහා තෝරාගනු ලබන ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් කිහිපදෙනෙකු සම ලකුණු ලබාගතහොත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) ප්‍රකාරව එකී සම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් සීමාවූ අමතර කුසලතා-පාදක සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගැනීම සිදුකරනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණයක් උපයෝගී කර ගනු ලැබේ. අදාළ අයදුම්කරුවන්ට මෙම ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණය පිළිබඳව එම අවස්ථාවේ දී පූර්ව දැනුවත් කිරීමක් සිදුකරනු ලැබේ.

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පරිපාටිය

| *අනු අංකය* | *ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | **අධ්‍යාපන සුදුසුකම් -**<br><br>➢ ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්,<br>❖ පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 20<br>❖ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 15<br><br>*සැ.යු.* - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 20 |

| අනු අංකය | ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 02 | **වෘත්තීය සුදුසුකම් -**<br><br>➢ ක්ෂේත්‍රයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්,<br><br>❖ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 20<br>(කාලය අවුරුදු 1 කට වැඩි)<br>❖ මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 15<br>❖ මාස 6ත් මාස 3 අතර සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 10<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 20 |
| 03 | **අමතර පළපුරුද්ද -**<br><br>වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරෙහි වසර 05 ක ස්ථිර, සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන අමතර සක්‍රීය සේවා කාලය සඳහා පහත ආකාරයට ලකුණු දෙනු ලැබේ. වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට අමතර පළපුරුද්ද සඳහා වෙන් කර ඇති ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු දෙනු ලැබේ.<br><br>අමතර පළපුරුද්ද සඳහා වෙන් කර ඇති උපරිම ලකුණ<br>————————————<br>වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සහිත නිලධාරියාගේ සේවා කාලය (අවුරුදු x12 + මාස)<br><br>x අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු x12 + මාස) | 30 |
| 04 | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය -**<br><br>❖ අයදුම්කරු තමන් ලබා ඇති පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ මූලික උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම. ලකුණු 15<br><br>❖ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් හදාරන ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. (කාලය අවුරුදු 1 කට වැඩි) ලකුණු 10<br><br>❖ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් හදාරන ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා. ලකුණු 05<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | 15 |

| අනු අංකය | ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 05 | **පරිගණක හැකියාව -**<br><br>➢ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක<br>පරිගණක විද්‍යාව පිළිබඳව<br><br>❖ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. ලකුණු 10<br>❖ සය මාසික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. ලකුණු 07<br>❖ සය මසකට අඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 05<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 10 |
| 06 | **සම්මුඛ පරීක්ෂණය -**<br><br>➢ පෞරුෂත්වය ලකුණු 02<br>➢ නායකත්වය ලකුණු 02<br>➢ සන්නිවේදන හැකියාව ලකුණු 01 | 05 |
| **එකතුව** | | 100 |

***සැ.යු. -*** සහතික පත්‍ර හා ලියවිලි මගින් සම්මුඛ පරීක්ෂණයේ දී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. බඳවා ගැනීමේ දී මූලික සුදුසුකමක් ලෙස උපාධිය සලකා ඇති බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී ඒ සඳහා ලකුණු ලබා නොදේ.

4. මෙම තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය :

රා.පරි.ච. 10/2025 අනුව MN 7 – 2025 වැටුප් කාණ්ඩයේ, මාසික වැටුප් පරිමාණය :

රු.71,240 – 11X1,360 – 18 X 1,850 - රු. 119,500/- කි.

5. අයදුම්පත් යොමු කිරීම.

පහත සඳහන් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.01.26 දිනට හෝ ඊට පෙර** අයදුම්කරුවන් විසින් තම, අංශ ප්‍රධානී මගින් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහාවන සම්මුඛ පරීක්ෂණය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
පරිසර අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 26 දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***පරිසර අමාත්‍යාංශය***

වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්‍ෂක තනතුරට බඳවා ගැනීම

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** [ ]

01. නම:
 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: ...............................................
 (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, උදා : SILVA A.B.)

 1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ...............................................
 (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

 1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) : ...............................................
 ...............................................

02. 2.1 පුද්ගලික ලිපිනය :-...............................................
 ...............................................

 2.2 කාර්යාලයීය ලිපිනය :-...............................................
 ...............................................

 2.3 ලිපි යොමු කළ යුතු ලිපිනය :...............................................
 ...............................................

 2.4 දුරකථන අංකය : ...............................................

03. 3.1 උපන් දිනය: වර්ෂය : [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

 (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා ඇත.)

 3.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවු. : ................ මාස : .................. දින : ..................

 3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී [ ]
 පුරුෂ [ ]

 4.2 විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග: විවාහක [ ]
 අවිවාහක [ ]
 වැන්දඹු [ ]

04. වෙරළ සංරක්ෂණ නියාමක තනතුරට මුලින් පත් කළ දිනය : ...............................................

05. වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරට උසස් වීම් ලද දිනය : ...............................................

06. වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරේ වසර 05 ක සතුටුදායක හා සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන දිනය :- ..........................

07. අධ්‍යාපනික සුදුසුකම් (√ සලකුණ යොදන්න) :

| | උපාධියේ නම | ආයතනය | වර්ෂය |
|---|---|---|---|
| පශ්චාත් උපාධිය | | | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | |
| උපාධි | | | |

08. වෘත්තීය සුදුසුකම් :

| ලබා ඇති වෘත්තීය සුදුසුකම් | ආයතනය | කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

09. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියලුම තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මා මෙම තනතුරට තෝරාගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය : ................................. ................................................
ඉල්ලුම්කරුගේ අත්සන

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතු ය.**

01. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමකට ලක්ව තිබේ ද? ඔව් / නැත

02. පිළිතුර **"ඔව්"** නම් ඒ පිළිබඳ ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේ ද? ................................................................................................
................................................................................................................................................................

03. නිලධාරියා සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේ ද? ඔව් / නැත

04. පිළිතුර **"ඔව්"** නම් ලබාගත් වැටුප් රහිත නිවාඩු ගණන කොපමණ ද?

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසිය | කාල සීමාව | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| i. | ආයතන සංග්‍රහයේ < V:2:5:4 | | |
| ii. | ආයතන සංග්‍රහයේ< XII:16 | | |
| iii. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 10 | | |
| iv. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 33 | | |
| v. | ආයතන සංග්‍රහයේ<XII:36 | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | |

මෙම දෙපාර්තමේන්තුවේ ...................................................................................................... තනතුර දරන .................
............................................................මයාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ...................................... .......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2025 (2026)**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුරු එකක (01) පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය - නීති සහකාර
සේවා ගණය - ආශ්‍රිත නිලධාරි
පුරප්පාඩු ගණන - 01

**02. අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**03. වැටුප :**

I. වැටුප් කේත අංකය : MN 4 -2025 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව)
II. වැටුප් පරිමාණය : රු. 53,060- 10 x800 -11x 1,190 – 10 x1,320–5 x1,350 - රු. 94,100/=
III. වැටුපට අමතරව රජය අනුමත ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**04. වයස :**

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

**05. කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**06. වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් **2026.01.23** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 08 යටතේ සඳහන් ලකුණු දීමේ පරිපාටියට අනුකූලව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්* | 20 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම්* | 15 | |
| පළපුරුද්ද* | 30 | |
| භාෂා හැකියාව* | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | **100** | |

* සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

**09. පත්වීමේ ස්වභාවය :**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

II. තෝරාගත් අපේක්ෂකයින් පත්වීමේ දින සිට තුන් අවුරුදු (03 ) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

III. පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

IV. පත්වීම් ලාභීන් විසින් රජය විසින් පත්වීමට අදාළව නියම කරනු ලබන අනෙකුත් අවශ්‍යතාවයන් නිසි පරිදි සම්පූර්ණ කර ගැනීම සිදුකළ යුතු ය.

**10. අයදුම් කිරීමේ ක්‍රමය:**

I. ආදර්ශ අයදුම්පත මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම පිළියෙළ කළ යුතු අතර, එය තමාගේම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. අයදුම් පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා “අදාළ නොවේ” යනුවෙන් සටහන් කළ යුතු ය.

අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබාගත යුතු ය. (ආදර්ශ අයදුම්පතේ අංක 01 සිට අංක 06 දක්වා පළමු පිටුවේද අංක 07 සිට අංක 8.2 දක්වා දෙවන පිටුවේද අංක 8.3 සිට අංක 11 දක්වා තෙවන පිටුවේද 12 සිට 14 දක්වා සිව්වන පිටුවේද වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න.) ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රමාණවත් වනු ඇත.

II. **අයදුම්පත් යොමුකළ යුතු ආකාරය සහ අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය**

**අයදුම්පත් 2026.01.23 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ - 10. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.** එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ" නීති සහකාර තනතුරට බඳවා ගැනීම" ලෙස පැහැදිළිව සඳහන් කළ යුතු ය.

III. **දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අයදුම්පත්**

දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

**IV. අයදුම්පත් සහතික කිරීම**

දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධරයෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / නොතාරිස් කෙනෙකු / රජයේ පාසලක විදුහල්පති වරයෙකු/ නාවික/ ගුවන්/ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු/ රජයේ ස්ථිර සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජා පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම**:

අයදුම්කරුවන් තම අයදුම්පතේ සඳහන් කර ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදිබව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙරාතුව හෝ එය පවත්වන අවස්ථාවේ දී හෝ ඉන් පසුව හෝ කවර අවස්ථාවකදී වුවද අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

12. මෙම නිවේදනයේ සඳහන් නොකරන ලද අදාළවන්නා වූ වෙනයම් කරුණක් වේ නම් එය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

**2025 දෙසැම්බර් මස 19 දී ය.**
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත.
කොළඹ - 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

***ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නීති සහකාර තනතුරට බඳවා ගැනීම - 2025(2026)***

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය ඉදිරියේ √ ලකුණ යොදන්න.(පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

01. අයදුම්කරුගේ නම :

1.1 මුලකරු අගට යෙදූ මුලකුරු සමග නම:..............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා: SILVA, A.B.)

1.2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..........................................................................................
(ඉංග්‍රීසී කැපිටල් අකුරින්)

1.3. මුලකරුඅගට යෙදූ මුලකුරු සමග නම:
.......................................................................................................................... (සිංහලෙන්/දෙමළෙන්)

1.4. මුලකුරුවලින් හැඳින්වෙන නම් ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී ☐ පුරුෂ ☐

(අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න.)

04. අවිවාහක විවාහක භාවය:

විවාහක ☐ අවිවාහක ☐

(අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න.)

05. උපන් දිනය: අවුරුද්ද : | | | | | මාසය: | | | දිනය: | | |

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | | | මාස: | | | දින: | | |

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකුද යන්න: ඔව් : ☐ නැත : ☐

(අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න.)

07. I. පෞද්ගලික ලිපිනය : (ස්ථිර)
..........................................................................................
..........................................................................................
..........................................................................................
(ලිපිනය වෙනස් වුවහොත් ඒ ගැන වහාම දැන්විය යුතුය.)

II. පෞද්ගලික ලිපිනය : (වර්තමාන) ..........................................................................................
..........................................................................................
..........................................................................................
..

III. ඊ මේල් ලිපිනය : ..........................................................................................

IV. දුරකථන අංකය: ස්ථාවර : ................................................ ජංගම : ....................................................

08. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස.(සා. .පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය හා මාසය : ………………………….. විභාග අංකය : .........................................

මාධ්‍ය : .........................................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

(ලබාගෙන ඇති ඉහළම සුදුසුකම් සඳහන් කරන්න.)

8.2 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය හා මාසය : ........................................ විභාග අංකය : ...........................................

මාධ්‍ය : ............................................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

(ලබාගෙන ඇති ඉහළම සුදුසුකම් සඳහන් කරන්න.)

8.3 නීති ක්ෂේත්‍රයේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

| විභාගය/උපාධිය | ක්‍රියාත්මක වන දිනය | විශ්වවිද්‍යාලය/ආයතනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8.4 වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

| සුදුසුකම | ක්‍රියාත්මක වන දිනය | ලබාගත් ආයතනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේද? ...............................................
(එසේ නම් විස්තර දක්වන්න.)

10. ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වෙනම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේද?.............................................................................................................................................

11. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියෙන් වරදකරු වී තිබේද? (ඔව් නම් විස්තර දක්වන්න)
.............................................................................................................................................
.............................................................................................................................................

12. ඔබ පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

1. නම :.........................................................
තනතුර :....................................................
ලිපිනය :...................................................
......................................................
දුරකතන අංකය : ....................................

2. නම : ................................................................
තනතුර : ..........................................................
ලිපිනය :.............................................................
………………………………………..
දුරකතන අංකය : ................................................

2. **අයදුම්කරුගේ සහතිකය:**

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය වූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා සියලු අයිතිවාසිකම් රහිතව තනතුරෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

දිනය : ................................. අයදුම්කරුගේ අත්සන : ................................

**13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න.)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………………………………………………………………….....................................
.........................................(සම්පූර්ණනම) මහතා/මහත්මිය/මෙනවිය යන මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු /ඇය 2026................. මස......දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

....................................................
සහතික කරන අයගේ අත්සන
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : .......................................................
තනතුර : .....................................
ලිපිනය : .........................................
දිනය : ............................................ (නිල මුද්‍රාව තබන්න.)

**14. අයදුම්කරු රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

මෙම අයදුම්පත් ඉදිරිපත් කරන ..................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය.......................................................................... (අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/රාජ්‍ය සංස්ථාවේ,.................................................) සේවයේ නියුක්ත බවත්,ඔහුට/ඇයට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් නොමැති බවත්, ..........................දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. තවද ඔහු/ඇය නීති සහකාර තනතුර පත් කිරීම සඳහා තෝරාගතහොත් මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ,.........................................................) සේවයෙන් මුදා හැරිය හැකිය.

....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ සම්පූර්ණ නම : .........................
තනතුර : .....................................
රාජකාරී ලිපිනය : .........................................
(නිල මුද්‍රාව තබන්න.)
දිනය : ......................................

12 - 585

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයට අයත් ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2026

මෙම *ගැසට් පත්‍රය* අනුව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් සඳහා මෙම විභාගය **2026 වර්ෂයේ පළමු කාර්තුව තුළ කොළඹ දී** පැවැත්වේ. විභාගය පවත්වන ලබන දිනය පසුව දැනුම්දෙනු ලැබේ.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාර III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ලේඛන සහකාර III ශ්‍රේණයේ තනතුරට පත්කිරීම සඳහා තෝරාගනු ඇත.

**01. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

1.1 මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

1.2 මෙම තනතුරු සඳහා පත්වීම් ලබන නිලධාරින් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

1.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා/රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

1.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

1.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ ඉල්ලුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

**02. වැටුප් පරිමාණය :**

මෙම තනතුරුවලට අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව (MN-1-2025) රු. 45,230-10 x540-11x 630-10 x890-10 x1190 - රු. 78,360/- ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

**03. සුදුසුකම්/ පළපුරුද්ද :**

සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**3.1 අධ්‍යාපන සුදුසුකම් :**

(අ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරක දී විෂයයන් 06ක් සමත් ව තිබීම;

*සහ*

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*සටහන :*

(i) අයදුම්කරු විසින් තනතුරු සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යයට අදාළව අ. පො. ස. (සා. පෙළ.) සහ අ.පො.ස. (උ. පෙළ) භාෂා විෂයයන් සඳහා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(ii) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලැබූ ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වූ විට අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ඇති අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් හෝ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3.2 පළපුරුද්ද :

රජයේ පිළිගත් ආයතනයක පරිගණක කටයුතු පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු ය. (උදා : Open Office - Microsoft Office -Word - Excel යනාදිය).

3.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්,

ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය. (තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.)

3.4 වෙනත් සුදුසුකම් :

(I) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(II) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(III) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3.5 වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

04. ලිඛිත විභාගය :

4.1 ලිඛිත විභාගය : ලේඛන සහකාර

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| භාෂා හැකියාව | පැය 1 | 100 | 40 |

4.1.1 විෂයය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

4.2 බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40% කට වඩා ලබාගත් අයදුම්කරුවන්ගෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් (පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) නීති කෙටුම්පත් සම්පාදක විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, නිවේදනයේ සඳහන් සුදුසුකම් සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සිදු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

05. විභාග කොන්දේසි :

5.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.2 සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැන ම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

5.3 විභාග ගාස්තුව රු. 1000/- කි.

අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 1,000/- ක විභාග ගාස්තුවක් "ලංකා බැංකුව අලුත් කඩේ" ශාඛාවේ "නීති කෙටුම්පත් සම්පාදක" නමින් පවත්වාගෙන යනු ලබන අංක 7041488 දරන ජංගම ගිණුමට බැරවෙන පරිදි ඕනෑම **ලංකා බැංකු** ශාඛාවකට ගෙවා ලබා ගන්නා ලදුපතෙහි දාරයකින් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවා තිබිය යුතු ය. එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවෙහි අයදුම්කරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ.

5.4 අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව සඳහන් කළ යුතු ය. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ

කරනු ලබන ඉල්ලුම් පත්‍රය, විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන :*

විභාග අපේක්ෂකත්වයට සුදුසුකම්ලත් සියලු අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විභාග ප්‍රවේශ පත්‍රයක් ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාග ශාලාව වෙත ඇතුළු වීමට විභාග අපේක්ෂකයන් වෙත ඉඩ නොදෙන අතර ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් පරිදි සුදුසුකම්ලත් අයකු ලවා තම අත්සන සහතික කරවා විභාග දිනයේ දී විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.5 ඉල්ලුම්පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාරව සෙ. මී. 24x29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර,

(අ) අංක 1 සිට 10 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද,
(ආ) අංක 11 සිට 15 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද,
(ඇ) අංක 16 සහ 17 ශීර්ෂ තෙවන පිටුවට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කළ යුතු ය.

5.6 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් යොමුකොට ඇති ඉල්ලුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ පසු ඔබ විසින් අයදුම්පත්‍රයේ යොදා ඇති ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් එවීම මගින් ඒ බව දැනුම් දෙනු ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දුරකතන අංක 011-5980236 හෝ 011-5980264 ඇමතීමෙන් විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳ විමසීම් කළ හැක. එසේ විමසීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍ර තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

5.7 විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය නීති කෙටුම්පත් සම්පාදකවරයා සතු වේ.

5.8 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

5.9 අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා විවෘත තරග විභාගය - 2026" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු ය.

5.10 අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම විභාග අපේක්ෂකයෙකු ම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය පහත සඳහන් වලංගු හැඳුනුම්පතක් මගින් ඔප්පුකර සිටිය යුතු ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**5.11 සැලකිය යුතු ය:**

(අ) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී අදාළ ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

06. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.01.26** දිනට හෝ ඊට පෙර "නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, අංක 80, අධිකරණ මාවත, කොළඹ 12" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

07. ප්‍රතිඵල නිකුත් කිරීම:

7.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ලිඛිත විභාගයේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කළ අවසන් ප්‍රතිඵල ලේඛනය නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත ලබා දෙනු ඇත.

7.2 තනතුරට අදාළ පත්කිරීම් අවසන් බව නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් දැන්වීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තැපැල මගින් සිදු කරනු ලැබේ.

08. පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් තීරණය කරනු ලැබේ. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය නීති කෙටුම්පත් සම්පාදකවරයා සතු වේ.

09. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

10. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් තීරණය කරනු ඇත.

**දිල්රුක්ෂි සමරවීර,**
නීති කෙටුම්පත් සම්පාදක.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

**ආදර්ශ අයදුම්පත්‍රය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් ලේඛන සහකාර III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

**Open Competitive Examination for the filling of vacancies in the Post of Documentation Assistant Grade III in the Legal Draftsman's Department - 2026**

**(ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද ඇතුළත් කළ යුතු ය.)**

01. ඉල්ලුම්කරන තනතුර : [ ]

සිංහල ලේඛන සහකාර - 1, දෙමළ ලේඛන සහකාර - 2, ඉංග්‍රීසි ලේඛන සහකාර - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

සිංහල - 1 දෙමළ - 2 ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම:

I. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:..........................................................................................................................
(උදා: GUNAWAEDHANA, M.G.B.S.K.)

II. සිංහලෙන් / දෙමළෙන් : ……………………………………………………………………………………

04. මුලකුරුවලින් හැඳින්වෙන නම:

I. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:..........................................................................................................................

II. සිංහලෙන් / දෙමළෙන් : ……………………………………………………………………………………

05. ස්ථිර ලිපිනය :

I. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:........................................................................................................................

II. සිංහලෙන් / දෙමළෙන් : …………………………………………………………………………………

06. විභාග ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය : ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

07. ස්ත්‍රී/පුරුෂ භාවය: [ ]

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. ජංගම දුරකතන අංකය: .................................. 09. වට්ස්ඇප් අංකය : ..........................................

10. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

11. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද : [ ]

ඔව් - 1
නැත - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

12. උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

13. 2026.01.26 දිනට වයස :

අවුරුදු : [ ][ ][ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

14. අධ්‍යාපන සුදුසුකම් :

I. අ.පො.ස.(සා. .පෙළ) විභාගය :

(i.) වර්ෂය හා මාසය : …………………………..
(ii.) විභාග අංකය : .........................................

| *විෂයය* | *සාමාර්ථයන්* | *විෂයය* | *සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. අ.පො.ස.(උ.පෙළ) විභාගය :

(i.) වර්ෂය හා මාසය : …………………………..
(ii.) විභාග අංකය : .........................................

| විෂයය | සාමාර්ථයන් | විෂයය | සාමාර්ථයන් |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

III. අදාළ වන වෙනත් අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න : ...........................................................

IV. වෘත්තීය පළපුරුද්ද : ..........................................................................................................................................

15. I. අධිකරණයක් ඉදිරියේ ඔබ කෙදිනක හෝ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද ?

ඔව් ☐ නැත ☐

ඔව් නම්, ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න : ..................................................................................................
..................................................................................................

II. විභාග ගාස්තු : ……………………………………………………………
ලදුපත් අංකය : ..........................................................................................
මුදල් ගෙවූ දිනය : ....................................................................................
මුදල් ගෙවූ බැංකුව සහ ශාඛාව : ..............................................................

| ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

16. අයදුම්කරුගේ සහතිකය :

(අ). මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්ත ව ප්‍රකාශ කර සිටිමි/ දිවුරුම් දෙමි.

(ආ). ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බැව් හෝ වැරදි බැව් මා තෝරා ගනු ලැබීමට පෙර ඔප්පු වුවහොත්, මා නුසුදුස්සකු බවට තීරණය කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු අසත්‍ය බැව් හෝ වැරදි බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොමැති ව අදාළ ක්‍රියාමාර්ගවලට යටත් ව, සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන රීතිවලට මම යටත් වන බව ද විභාගයට අදාළ ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත මෙයට අලවා ඇති බව ද ප්‍රකාශ කරමි.

දිනය: ..........................................................................,
ඉල්ලුම්කරුගේ අත්සන

17. I. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................................. (සම්පූර්ණ නම) මහතා/ මහත්මිය/ මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 202............. මස ............................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.....................................................,
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..........................
තනතුර : .....................................
ලිපිනය : ........................................
දිනය : .......................................
(නිල මුද්‍රාව තබන්න.)

II. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉල්ලුම්කරු/ ඉල්ලුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර මා පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළහැකි ය. / නොහැකි ය.

.....................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

පදවි නාමය :
දිනය:
((නිල මුද්‍රාව තබන්න.)

12 - 440

---

සංශෝධනයයි

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ ඛණ්ඩය - 3) (MT-1) සේවා ගණයේ තාක්ෂණ සහායක ඉංජිනේරු (සිවිල්/විදුලි/යාන්ත්‍රික) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

"2025.11.28 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද තාක්ෂණ සහයක ඉංජිනේරු (සිවිල්/විදුලි/යාන්ත්‍රික) තනතුරු සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ

අංක 8 "බඳවා ගැනීමේ ක්‍රමය" - අනු අංක "I" පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

"ඉහත සඳහන් විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 50% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ."

**ආචාර්ය ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමාරච්චි,**
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 දෙසැම්බර් මස 08 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශයේ දී ය.

12 - 523

සංශෝධනයයි

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ ඛණ්ඩය - 3) (MT-1) සේවා ගණයේ කෘෂි ව්‍යාප්ති/ කෘෂි පර්යේෂණ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

"2025.11.28 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද තාක්ෂණ සහයක (කෘෂි ව්‍යාප්ති/ කෘෂි පර්යේෂණ) තනතුරු සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ

අංක 8 "බඳවා ගැනීමේ ක්‍රමය" - අනු අංක "I" පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

"ඉහත සඳහන් විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 50% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ."

**ආචාර්ය ඩබ්. ඒ. ආර්. ටී. වික්‍රමාරච්චි,**
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2025 දෙසැම්බර් මස 08 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශයේ දී ය.

12 - 524

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අනුමත තනතුරු පවතින අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා **පුරප්පාඩු 23ක්** සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ නිරතව සිටින නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 දෙසැම්බර් මස 29 දින පැය 09.00ට** ආරම්භවන අතර **2026 ජනවාරි මස 23 දින පැය 21:00ට අවසන් වේ.**

01. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 අප්‍රේල් මස කොළඹ දී** පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්ත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එතකුදු වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කර නොමැති අවස්ථාවකදී එම මධ්‍යස්ථානයට මනාපය පළකර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

මෙම නිවේදනයේ "පත්කිරීමේ බලධරයා" යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

**02. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

2.1 මනාපය සටහන් කිරීම :

එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමට තිබිය යුතු සුදුසුකම් සපුරා ඇත්නම් අයදුම්කරුවකුට තනතුරු කිහිපයකට අයදුම් කිරීමට හැකියාව ඇත. අයදුම් කිරීමේ දී අයදුම්කරුවන් විසින් එක් එක් තනතුර සඳහා තම මනාප අනුපිළිවෙළ අයදුම්පතේ සටහන් කළ යුතුය.

***සැලකිය යුතුයි :*** එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කිරීමේ දී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාප අනුපිළිවෙළ පසුව සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරු විසින් මනාපය සටහන් කර නොමැති තනතුරු සඳහා පත්වීම් ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් කිසිදු කරුණක් මත සලකා බලනු නොලැබේ.

2.2 ලිඛිත විභාගය : මෙම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 03 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

***සටහන :*** බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය සියලුම දෙපාර්තමේන්තු සඳහා පොදු ප්‍රශ්න පත්‍රයක්වන අතර විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රය එක් එක් දෙපාර්තමේන්තුවේ අදාළ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විෂයය නිර්දේශය අනුව සකස් කරනු ලබන බහුවරණ, කෙටි ලිඛිත හා අර්ධ ව්‍යූහගත ප්‍රශ්නවලින් සමන්විත වේ.

2.3 සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබා සමත් වූ අයදුම්කරුවන්ගේ ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. එක් එක් තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් ආකාරයට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හෝ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

2.4 එක් එක් තනතුරුවලට අදාළවන පරිදි අයදුම්පතේ සටහන් කර ඇති මනාපය හා ලිඛිත විභාගයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත එක් එක් තනතුර සඳහා පත්කිරීම් කරනු ලැබේ.

කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම

පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්ත ය.

I. අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පැවැත්වෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

මෙම තෝරාගැනීමේ පටිපාටියේ ව්‍යූහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු www.psc.gov.lk හි රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පහත වෙබ් පිටුවේ පළ කර ඇත.

මුල් පිටුව ⟶ බාගත කිරීම් ⟶ ක්‍රියා පටිපාටි ⟶ විශේෂ තෝරා ගැනීමේ පටිපාටිය

2.5 එක් එක් තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මකවන දිනය පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලැබේ. අදාළ තනතුරු සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ සහ ලබා දී ඇති මනාපය තරයේම පදනම් කරමින් පත්වීම් සිදු කරනු ලැබේ. කිසියම් තනතුරක පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් යම් කොටසක් පිරවීමට හෝ නොපිරවීමට හෝ පත් කිරීමේ බලධරයාහට බලය ඇත.

**03. පුරප්පාඩු සංඛ්‍යාව : 23**

පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව එම තනතුරු අයත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු අනුව තවදුරටත් බෙදී ඇති ආකාරය මෙම නිවේදනයේ 6.2 හි අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද යටතේ දක්වා ඇත.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද අංක 1877/27 දරන 2014.08.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා විධිවිධානවලට ද අදාළවන පරිදි දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ මුදල් රෙගුලාසිවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්යය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන), එක් එක් තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවලට ද ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින් මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් අදාළ තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3. මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5. පත්වීම්ලාභියකු දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත්වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**05. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 2025/10 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 82,150-10x 2,400-8x 2,940–17x 3,900–195970/- (SL–1–2025)

වන අතර එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ උපලේඛන III අනුව

වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

**06.** **බඳවා ගැනීමේ සුදුසුකම් :**

6.1 සාමාන්‍ය සුදුසුකම් :

i. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

ii. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම තනතුරේ භූමිකාව හා කාර්යයභාරය හොඳින් ඉටු කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

v. ලිඛිත විභාගයට දෙවතාවකට වඩා පෙනී නොසිටි අයකු විය යුතු ය.

vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**6.2** **අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

| *අනු. අංක* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,<br><br>(අ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යා හෝ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ උපාධියක් සහිත යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති MN 4 වැටුප් කේතය යටතේ වැටුප් ලබන නිලධරයකු වීම;<br><br>*හෝ*<br><br>(ආ) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට උසස්වීම් ලැබ I වන ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධරයකු වීම;<br><br>*හෝ*<br><br>(ඇ) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම. |

| අනු. අංක | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;<br>සහ<br>(අ)<br>i. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධරයකු වීම.<br>ii. අදාළ තනතුරේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;<br>හෝ<br>(ආ)<br>i. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මිනුම් විමර්ශන සහකාර නිලධරයකු වීම.<br>ii. අදාළ තනතුරේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>(ඇ)<br>i. සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරී නිලධරයකු වීම.<br>ii. මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකයකු ලෙස සේවා කාලය ද ඇතුළත්ව වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.<br>iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>හෝ |

| අනු. අංක | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ඇ)<br>i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක හෝ රසායනාගාර සහකාර නිලධරයකු වීම.<br><br>ii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br><br>iii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;<br><br>*හෝ*<br>(ඉ)<br>i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක නිලධරයකු වීම.<br><br>ii. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 03 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 03 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,<br><br>(අ) භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 04 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ) | 03 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට අයත් වන පාලක නිලධරයකු වීම. |

| අනු. අංක | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|---|
| 05 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර වන සංරක්ෂක (පර්යේෂණ) | 01 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට අයත් වන පාලක නිලධරයකු වීම. |
| 06 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර වන සංරක්ෂක (අධ්‍යාපන) | 01 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට අයත් වන පාලක නිලධරයකු වීම. |
| 07 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 | (අ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී තනතුරේ වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත එම සේවයේ I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම;<br><br>හෝ<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, කෘෂි විද්‍යා හෝ විද්‍යාවේදී උපාධියක් සහිත අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති තාක්ෂණ නිලධරයකු වීම. |
| 08 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ජල විද්‍යා දත්ත අධිකාරී | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල විද්‍යා සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයකු වීම. |
| 09 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඉංජිනේරු ද්‍රව්‍ය අධිකාරී | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉංජිනේරු ද්‍රව්‍ය අංශයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයකු වීම. |
| 10 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ අධිකාරී | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම. |
| 11 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ජල ශක්ති අධිකාරී | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල ශක්ති අංශයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම. |

| අනු. අංක | දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|---|
| 12 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඉඩම් පරිහරණ අධිකාරී | 02 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පාංශු ප්‍රස්තාරක තනතුරේ හෝ පස් සමීක්ෂක තනතුරේ හෝ පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ I ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම. |
| 13 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පස් රසඥ | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පස් සමීක්ෂක තනතුරේ හෝ පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ I ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම. |
| 14 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | උපකරණ අධිකාරී | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල ශක්ති පර්යේෂණාගාරයට සම්බන්ධ උපකරණ අංශයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම හෝ I ශ්‍රේණියේ වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම |
| 15 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී විශේෂ *හෝ* සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;<br>*සහ*<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයකු වීම හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම. |

**07. විභාග කොන්දේසි :**

7.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම්කරනු ලබන තනතුරුවලට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.2 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එහි උපදෙස් තරයේ පිළිපදින්න. මාර්ගගතව යොමු කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුව ට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පතේ පිටපතක් ලබා ගැනීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

7.3 මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 1200/= කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණයකාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transaction)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking method of bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the bank of Ceylon)

*සටහන :* ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් www.doenets.lk වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන නියමිත මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

7.4 අයදුම්කරු ළඟ තබා ගන්නා අයදුම්පතේ මුද්‍රිත පිටපතෙහි සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු විසින් සහතික කර තිබිය යුතුය.

7.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී/ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

*සටහන :* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි.

7.6 අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

7.7 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කරවා ගත යුතුය.

7.8 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන ලද විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු වේ.

7.9 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

7.10 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම

ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා වලංගු වනුයේ පහත ලේඛනයක් පමණි.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරුකර ගත හැකි වන පරිදි සහ විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්ව ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව පත්වීම් ලබා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කරන අතර අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/ පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් අයකර ගනු ලැබේ.

09. **විභාග මාධ්‍ය :**

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) විභාගයට පෙනී සිටින මාධ්‍ය පත්වීම් මාධ්‍ය ලෙස සලකනු ලැබේ.

(ඇ) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(ඈ) තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

10. පත්කිරීමේ බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

11. මෙහි විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය පත්කිරීමේ බලධරයා සතු වේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. අලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 20 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

12 - 615

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.